# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2007 අංක 15 දරන ආර්ථික සේවා ගාස්තු
# (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II
වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිල : රු. 8.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි**

## 2007 අංක 15 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 9/2007.

### ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 15 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2007 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "පිරිවැටුම, ඒ අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන දහය නොඉක්මවන අවස්ථාවල දී යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තාගෙන් හෝ හවුල් ව්‍යාපාරයෙන් අයකළ හැකි සේවා ගාස්තුව අය කරනු නොලැබිය යුතු ය." යන වචන හා ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"පිරිවැටුම,—

(i) 2007 මාර්තු මස 31 වන දිනට පෙර ආරම්භ වන අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන දහය නොඉක්මවන අවස්ථාවල දී ; සහ

(ii) 2007 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන අදාළ කාර්තුව සඳහා රුපියල් හැත්තෑපන් ලක්ෂය නොඉක්මවන අවස්ථාවල දී,

ඒ අදාළ කාර්තුව සඳහා ඒ තැනැත්තාගෙන් හෝ හවුල් ව්‍යාපාරයෙන් අයකළ හැකි සේවා ගාස්තුව අයකරනු නොලැබිය යුතු ය."

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයෙහි, "ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්" යන

වචනවල සිට "ව්‍යාපාරයක් ඇතුළත් නොවිය යුතු ය." යන වචන දක්වා සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(i) 2006 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වී 2007 මාර්තු මස 31 වන දින අවසන් වන තක්සේරු වර්ෂයේ යම් අදාළ කාර්තුවක් සඳහා ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් සෑදීම හෝ නිපදවීම නොකරන ලද භාණ්ඩ කිසිවක් තොග හෝ සිල්ලර වශයෙන් වෙළෙඳාම් නොකරන යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් ඇතුළත් නොවිය යුතු ය ; සහ

(ii) 2007 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක අදාළ කාර්තුවක් සඳහා —

(අ) නිෂ්පාදන ව්‍යාපාරයේ නිරත නොවන්නා වූ ද;

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 24ආ වගන්තියේ සඳහන් කරනු ලබන නැවත විවෘත කළ කර්මාන්ත ශාලාවක යම් ව්‍යාපාරයක් නොවන්නා වූ ද,

යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් ඇතුළත් නොවිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (3) වන, (4) වන සහ (5) වන උපවගන්ති ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) අවස්ථාවෝචිත පරිදි (1) වන හෝ (2) වන උපවගන්තිවලට අනුකූලව අඩු කිරීමෙන් පසු, ආර්ථික සේවා ගාස්තුව වශයෙන් අය කරනු ලැබූ මුදලේ යම් ශේෂයක් ඇත්නම්, එය පළමුව සඳහන් කළ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු

හතරක කාලයක් ඇතුළත වූ එක් එක් තක්සේරු වර්ෂයට විභජනය කළ හැකි අතර, එසේ විභජනය කරනු ලැබූ මුදල් ප්‍රමාණ එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරයේ හවුල්කරු විසින් එම එක් එක් තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කළ හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය.";

(2) එහි (6) වන උපවගන්තිය, (4) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(3) නැවත අංක යෙදූ (4) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) (3) වන උපවගන්තියට අනුකූලව අඩු කිරීමෙන් පසු එම උපවගන්තියේ සඳහන් ශේෂයේ යම් ඉතිරි කොටසක් ඇත්නම්, එම ඉතිරි කොටස, පළමුව සඳහන් තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන හතරවන තක්සේරු වර්ෂයට පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු යම් ආදායම් බද්දකින් අඩු කරනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ "3 වන වගන්තියේ (6) වන උපවගන්තියේ (ආ) අනුඡේදයෙහි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "3 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) යම් තක්සේරු වර්ෂයක යම් අදාළ කාර්තුවක් සඳහා ආර්ථික සේවා ගාස්තු ගෙවීමට යටත් තැනැත්තෙක් හෝ හවුල් ව්‍යාපාරයක් නියමිත මුදලට වඩා අඩුවෙන් තක්සේරු කර ඇති බවට තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක

(3) වන උපවගන්තියේ හා (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, (මුලින් තක්සේරු කළ මුදලට අමතරව තක්සේරුකරුගේ මතය අනුව තක්සේරුකරු හෝ හවුල් ව්‍යාපාරය තක්සේරු කළ යුතුව පැවති මුදල වූ) අතිරේක මුදලක් සඳහා තක්සේරුකරු විසින් එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය තක්සේරු කරනු ලැබිය හැකි අතර තක්සේරුව පිළිබඳ දැන්වීම, අභියාචනය සහ වෙනත් නීති කෘත්‍ය සම්බන්ධයෙන් වූ මේ පනතේ විධිවිධාන එම අතිරේක මුදල අයකර ගැනීම සඳහා අදාළ විය යුතු ය.

(3) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ආර්ථික සේවා ගාස්තුවේ වාර්තාවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් තක්සේරුකරුවකු විසින් තක්සේරුවක් කිරීමේ දී—

(අ) එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිගත යුතු ය ; නැතහොත්

(ආ) එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිගැනීම ප්‍රතික්ෂේප කර අදාළ පිරිවැටුමේ මුදල ඇස්තමේන්තු කර ඒ අනුව අදාළ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය තක්සේරු කළ යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් තක්සේරුකරු විසින් භාර නොගෙන (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් යම් අදාළ කාර්තුවක් සඳහා කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව තමා භාර නොගන්නේ ඇයි ද යන්න පිළිබඳ තක්සේරුකරු විසින් එම තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(4) 7 වන වගන්තියේ සඳහන් දිනවල දී හෝ එදිනට පෙර යම් තක්සේරු වර්ෂයක යම් අදාළ කාර්තුවක් සඳහා වාර්තාවක් ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ කිසිදු තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් නොකළ යුතු අතර, ඔහුගේ හෝ එහි ආදායම් වර්තාව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ

106 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ආදායම් වාර්තාවක් ඉදිරිපත් කර ඇත්නම්, අදාළ කාර්තුව ඇතුළත් වන තක්සේරු වර්ෂය අවසානයේ සිට මාස දහඅටක් ගතවීමෙන් පසුව පමණක් එම තක්සේරුව හෝ අතිරේක තක්සේරුව කළ යුතු ය.”.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ “තැනැත්තා” යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි (ආ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් 13 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි යම් ආණ්ඩුවේ ආයතනයක් හෝ පළාත්පාලන ආයතනයක්.”.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

උපලේඛනය

| යටත් පිරිවැටුමේ කොටස | ඒ කොටසට අදාළ වන සේවා ගාස්තු අනු ප්‍රමාණය |
|---|---|
| 1. (i) ලාභ සහ ආදායම් බද්දෙන් නිදහස් කෙරෙන යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ;<br>(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ගිවිසුමකට එළඹ ඇති ව්‍යවසායක, ලාභ සහ ආදායම එම ගිවිසුම යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද, එම කාලසීමාව තුළ එම ව්‍යවසායේ යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින්,<br>ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.25 |

| | |
|---|---|
| 2. (මෝටර් වාහන හෝ මත්පැන් බෙදාහරින්නකු හෝ වෙළෙන්දකු වශයෙන් හැර) වෙළෙන්දා විසින් නිපදවනු නොලැබූ හෝ සාදනු නොලැබූ භාණ්ඩ කිසිවක් තොග හෝ සිල්ලර වශයෙන් විකුණන යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින්, ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.25 |
| 3. යම් මද්‍යසාරමය පානයක් නිපදවීමේ දී සිදු කරන පරිවර්තනයක් නොවන වියළන ලද පොල්, පොල්තෙල්, පොල් කොහු, කොප්පරා හා ෂීට් රබර් ඇතුළත් වන තේ, රබර් හෝ පොල් වැවිල්ලක මූලික නිෂ්පාදන පරිවර්තනය කිරීමකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.25 |
| 4. (i) දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 28 වන අයිතමය හැර එම උපලේඛනයේ සඳහන් යම් අනුප්‍රමාණයකට අනුව ලාභ සහ ආදායම් මත බදු අය කළ හැකි ;<br>(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ගිවිසුමකට එළඹ ඇති යම් ව්‍යවසායක ලාභ හා ආදායම එම ගිවිසුම යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන්නේ යම් කාල සීමාවක් සඳහා ද එම කාලසීමාව තුළ එම ව්‍යවසායේ, ලාභ සහ ආදායම මත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණයට සමාන අනුප්‍රමාණයකට බදු අයකළ හැකි,<br>යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.5 |
| 5. වෙළෙන්දකු විසින් නිෂ්පාදනය කරනු නොලැබූ මෝටර් වාහන හෝ මත්පැන් (බෙදාහැරීම හැර) තොග හෝ සිල්ලර වශයෙන් විකුණන යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.5 |
| 6. යම් පිරිවැටුමක් මේ උපලේඛනයේ 1 වන, 2 වන හෝ 3 වන අයිතමවල සඳහන් නිශ්චිත පිරිවැටුමක් යටතට වැටෙන අවස්ථාවක දී හැර, දේශීය ආදායම් පනතේ 2 වන උපලේඛනයේ අ හෝ ආ (i) කොටස්වල නිශ්චිතව දැක්වෙන යම් අනුප්‍රමාණයකට අනුව ලාභ සහ ආදායම් මත ආදායම් බදු අයකළ හැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.5 |

| | |
|---|---|
| 7. බෙදාහරින්නකු වශයෙන් යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.05 |
| 8. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ සඳහන් යම් අනුප්‍රමාණයක් නොවන අනුප්‍රමාණයකට අනුව ලාභ හා ආදායම් මත ආදායම් බදු අයකළ හැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන ලාභ හා ආදායමේ පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 1.0 |
| 9. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 28 වන අයිතමයේ සඳහන් යම් ක්‍රියාකාරකමකින් හෝ පවත්වාගෙන යන යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 1.0 |
| 10. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 42 වන වගන්තියේ සඳහන් යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.1 |
| 11. (i) යම් අපනයනකරුවකු විසින් ඇඟලුම් අපනයනය කිරීමෙන් හෝ ඇඟලුම් අපනයනය කරන්නන්ට දේශීය වශයෙන් නිෂ්පාදිත රෙදි සැපයීමෙන් ලැබෙන පිරිවැටුමේ ;<br>(ii) ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් වෙළෙඳ ආයතනයක් ඇඟලුම් අපනයනය කිරීමෙහි නියැලී සිටිනතාක් දුරට, එම වෙළෙඳ ආයතනයේ පිරිවැටුමේ,<br>ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.1 |
| 12. මෙම උපලේඛනයේ අංක 1 සිට 11 දක්වා ඇති අයිතමවලට ඇතුලත් නොවන පිරිවැටුමක යම් අදාල වන කොටසක් | සියයට 1.0 |

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.